## තවත් ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 10 ක් ජනතා අයිතියට

පිරිසිදු පානීය ජල අවශ්‍යතාව සහිත මෙන්ම වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශ ඉලක්ක කරගනිමින් නාවික හමුදාව විසින් ප්‍රති ආශ්‍රැත ජල පෙරන පද්ධති ලබාදීම වෙනුවෙන් සිදුකරන ප්‍රජා සත්කාර ව්‍යාපෘතිය තවත් ඉදිරියට ගෙන යමින් ඊයේ දින (ජනː 09) සහ පෙරේදා දින (ජනː 08) තවත් ප්‍රටී ආශ්‍රැත ජල පෙරන පද්ධති *(Reverse Osmosis – RO)* පහක් ස්ථාපිත කොට ජනතා අයිතිය වෙනුවෙන් පවරාදීම සිදු කල බව නාවික හමුදා නිල වෙබ් අඩවිය පවසයි.

ඒ අනුව ඊයේ දින (ජනː 09) ප්‍රති ආශ්‍රැත ජල පිරිපහදු යන්ත්‍ර 3ක් ක් මහියංගනය බෙලිගල්ල ගම්මානයේ, ගිරාදුරුකෝට්ටේ ශ්‍රී ධර්මෝධය මහා පිරිවෙණ සහ පොල්පිතිගම නිකවැහැර ගම්මානයේ ස්ථාපිතකොට විවෘත කරන ලද අතර තවත් ජල පෙරන පද්ධති දෙකක් පෙරේදා දින (ජන 08) රිදීමාලියද්ද ප්‍රදේශයේ සහ පොල්පිතිගම තලාකොලවැව ගම්මානයේ ස්ථාපිත කොට ප්‍රයෝජනය පිණිස විවෘත කර ජනතා අයිතියට පවරාදී ඇත.

එමෙන්ම පසුගියදා තවත් ජලපෙරන පද්ධති 05ක් ජනතා අයිතියට පවරා ඇති අතර අනුරාධපුරය ස්වර්ණපාලී බාලිකා ප්‍රාථමික විද්‍යාලයේ සහ ස්වර්ණපාලී බාලිකා මහා විද්‍යාලයේ ජල පිරිපහදු යන්ත්‍ර 2 ක් ඇතුළුව අනුරාධපුර ප්‍රදේශය ආවරණය වන පරිදි තවත් ජල පිරිපහදු යන්ත්‍ර 3ක් ස්ථාපිත කොට ජනතා අයිතියට පත්කොට ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ වකුගඩු රෝගය ව්‍යාප්ත වන ප්‍රදේශ සහ පිරිසිදු පානීය ජල අවශ්‍යතාව සහිත ප්‍රදේශ ඉලක්ක කරගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ජල පිරිපහදු යන්ත්‍ර 96 ක් ස්ථාපිත කර පවුල් 45,130 කට හා පාසැල් දරුවන් 40,350 කට වැඩි පිරිසකට පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කර ඇති බව එම පුවත වැඩිදුරටත් සඳහන් කරයි.